# සේසත් නංවා

ලබන්නා වූ 2022 නව වසර
සුබ නව වසරක් වේවා......යි
සමවැදුම පාඨකයින් හට පතන්නෙමු.



ලොව සැවෙම පිළිගත් මාස ක්‍රමයට අනුව ජනවාරිය වසරේ මුල් ම මාසයයි. සිංහල මාස ක්‍රමයට අනුව මේ දුරුතු මාසයයි. පොයෙන් පෝයට මාස ගැනීමට හුරු වූ අපේ මුතුන් මිත්තන්ට අනුව දුරුතු පෝය දිනය මව් බිමේ ඉහළින් සමරනු ලබන්නේ කැලණි විහාරයේ පෙරහැරත් සමඟින්.

බොදු වටපිටාවකින් සංවිධානය වන දුරුතු පෙරහැර දෙස කලාත්මක ඇසින් බැලූ දෙටු කිවියරයෙකු මෙන් ම ගී පද නිබන්ධකයෙකු පබැඳූ රසවත් ගීයකි ''සේසත් නංවා'' ගීය.

පෙර දවස පවන් සලන්නට කෙඳිවර්ග යොදා කෙටි මිටකින් යුතුව නිමවාගත් මෙවලමයි චාමරය; නැතිනම සෙමෙර. ඇතු පිට කරඬුව වඩමවා චාමර සෙළවා ඊට පවන් සළමින්, සේසත් ඔසවාගෙන දුරුතු පෝ දා කැලණි විහාරයන් පිටත් වන පෙරහර දැන් නිබන්ධකයාණන් ඉදිරියෙන් ඇදෙයි. තම්මැට්ටම්, දවුල්, ගැටබෙර හඬට මුසු වෙන හොරණෑ, සක් නාදයට නර්තනයේ යෙදෙන්නන් සොළවමින් තබනා පාදවල ගිගිරි නාදය ද ඇසෙයි නිබන්ධකයාණන්ට.

කලා රසකාමී නිබන්ධක අවධානය නිතැතින්ම හිමිවෙන්නේ ලාලනියන්ගේ සුළලිත ගමනට. ඔවුන්ගේ ගමන් තාලය තිසරුන් පෙළක ගමන් තාලය සේමයි නිබන්ධකයාණන්ට. ප්‍රබෝධමත් වුණ රූසිරි අතරින් නෙත්වලින් ඉසිරෙන මුදු රැස්වලින් රස වෑහෙයි. මුහුණු දෙපස සවන්පත්වල හෙම්හිට නැළැවෙන තෝඩු පන්දම් එළියෙනි නිබන්ධකයාණන් දකින්නේ. ආලෝකමත් ප්‍රභාතයක දැල්වෙන පහන් තාරකා පායා ඒ මුළු ප්‍රදේශයම කල එළි කරවයි.

පෙරහැර ගමන් ගන්නා මේ රැය සීතලයි. දා බිඳු නොනැගෙයි මේ ලාලනියන් කෙතරම් නර්තනයෙහි යෙදුණත්. ඔවුන් ඇඳ සිටිනා සුදු සේලවල රැළි අතරෙයි නිබන්ධකයාණන්ගේ නෙත, සිත. මේ ගැමි ලියන් උදම් ව නර්තනයේ යෙදෙන කල නැටවෙන කෙහෙරැල, ගෙලවට බබලන මුතුමාල නිබන්ධකයාණන්ගේ සිතුවිලි පුබුදු කරවයි. රස ගංගාවක් ලෙසින් අන්දමන්දව, උදම් ව කැලණි විහාරේ පෙරහැර කාලයට වීදි සරනා කා වුව මේ කලාංගය බිඳුනු සිහින වලින් මැසිවිලි නගනා සිත් වලට සැනසීමක් ගෙන නො එන්නේද? අවසන නිබන්ධකයාණන් විමසයි.

මෙවන් හර බර පද පෙළක් රසයෙන් අනූනව පද පෙළකට කැටි කරවන්නේ දිවංගත ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ ප්‍රවීණ හා ජ්‍යෙෂ්ඨ ගී පද නිබන්ධකයාණන්. හෙළ හුරුව ඇතිව නිබන්ධනය කිරීමෙහි ලා පූර්වාදර්ශ දුන් පුරෝගාමී ගී පද නිබන්ධකයෙකු වූ මානවසිංහයන් අනුමග ගත් රචකයින් බොහෝමයි. හෙළ බසට ලොල්ව, ඊට ගරු කරමින් එය නිවැරදි දැක්මක් ඇතිව විකාශනය කිරීමෙහි ලා මානවසිංහයන් වඩාත් වැදගත් භූමිකාවක යෙදෙනුයේ ගී පද නිබන්ධනයේදී යි.

ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන්ගේ මේ අගනා පබැඳුම තනු ගන්වා, මියැසිය මුසු කොට තමන්ට ම අනන්‍ය වූ හෙළ කෝමළ මධුර හඬින් ගයන්නේ දිවංගත පණ්ඩිත් අමරදේවයන්. හෙළ සුභාවිත ගීය වෙනුයෙන් ඉඳුරා ම කැප ව ඒ වෙනුවෙන් නිරතුරුව ම පෙනී සිටි පණ්ඩිත් අමරදේවයන් මානවසිංහයන්ගේ පද පෙළ හා සුසංගයේගී වන්නේ පෙරහැරක අසන්නට ලැබෙන රිද්මය මුල් කොට ගත් තනුවක් නිර්මාණය කිරීමෙන්. තමන්ගේ සෞම්‍ය හඬට ගැලපෙන සේ ලයාන්විතව ගලා යන තනුවක් නිමවා ගන්නා අමරදේවයන් ඊට රද්මය කැවීමට උඩැක්කිය මුල් වුණ අපගේ හෙළ හේරි වාද්‍ය හඬ උපයෝගී කර ගනියි. පෙරහැරේ වැයෙනා හොරණෑ හඬ සිහිගන්වන බටනළා වාද්‍ය බණ්ඩ අතරට වයලීන හෝ සිතාර් හඬ අමරදේවයන් මුසු කරගන්නේ අනාගන්තුකවයි.

හෙමින් ඉදිරියට ඇදී යන පෙරහැරක නියාවෙන් සිය තනුවටත් රිද්ම රටාවන් අනුගතව ගලා යන ගායනීය රස ඕගයක් මවන්නට අමරදේවයන් සමත් වන්නේ සිය කෝමළ හඬින් ගැඹුරෙන් ගායනා ගායනයෙන්.

සේසත් නංවා සෙමෙර ද සොළවා
කරඬුව සදලා ගජයාගේ
දුරුතු පෝය දා කැලණි විහාරේ
පෙරහැර යනවා හඳ පානේ
තම්මැට දවුලේ හා ගැට බෙරයේ
හඬ මුසු හොරණෑ සක් නාදේ
සමඟින් එක් වේ ගිගිරිවි රාවේ
නළුවන් සොළවා තැබූ පාදේ

ලාලනියන්ගේ සුළලිත ගමනේ
තිසර ගමන් තාලය සෑදේ
පිබිදුණු උවනේ නෙත්වල කැල්මේ
මුදු රැස් ඉසිරේ රස වෑහේ
පන්දම් එළියේ තෝඩුද සවනේ
හෙම්හිට නැළැවේ වන දෑලේ
මිහිරි පබාතේ පහන් තාරකා
ගණනක් පායා එළෙලී වේ

සීත සමීරේ දා බිඳු නො නැගේ
රැළි රැළි නැංවේ සුදු සේලේ
කෙහෙරොද නැටවේ ගැමි ලිය ඔද වේ
ගෙල වට බැබලේ මුතු මාලේ
කැලණි විහාරේ පෙරහැර කාලේ
ඔද වැඩි මිහිරේ රස ඕගේ
බිඳුණු සිහින හා මැසිවිලි අතරේ
සැනසිලි නේවිද සිත කාගේ?

රචනය: ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ
තනුව, සංගීතය සහ ගායනය :
පණ්ඩිත් අමරදේව



සිසිර දිසානායක